ස.සෙ.කො.චක්‍රලේඛ අංක 06 /2019

මගේ අංකය : ස.සෙ.කො./5/1/iii වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ),
නව පළාත් සභා ගොඩනැගිල්ල,දෙවන මහල,
කුරුණෑගල.
2019.08. ०६

වයඹ පළාතේ සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
පළාත් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය හා,
වයඹ සමුපකාර මහා සංගමය, ස.ණ.ස.සංගම්,
ස.ණ.ස. සමිති, වෙනත් සමුපකාර සමිති හා සංගම් වල
ගරු සභාපති හා සාමාන්‍යාධිකාරී වරුන් වෙත,

## රු. 2500/- ක මාසික අන්තර් දීමනාවක් ගෙවීම.

රජය විසින් ප්‍රකාශිත 2019 අය වැය යෝජනා අනුව සියළුම රාජ්‍ය නිලධාරීන් සඳහා ක්‍රියාත්මක රු.2500/-ක මාසික අන්තර් දීමනාව 2019 සැප්තැම්බර් මස සිට වයඹ පළාතේ සමුපකාර සේවකයින්ට ගෙවීමට වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව තීරණය කර ඇත.මෙම ගෙවීම් කිරීම වෙනුවෙන් හෝ ගෙවීම් කිරීම අතරතුර විවිධ මූල්‍යමය දුෂ්කරතා පැන නගින්නේ නම් එම සමිති විසින් මේ පිළිබඳව මෙම කොමිෂන් සභාවට පිටපත් සහිතව සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්වරයා විමසා එම නිර්දේශ අනුව ඉදිරි කටයුතු කල යුතුය.

02. මෙකී මුදල මාසික අන්තර් දීමනාවක් ලෙස ගෙවිය යුතු අතර මූලික වැටුපට එකතුවීමක් සිදු නොවන බැවින් ඉදිරි වැටුප් ප්‍රතිශෝධනයකදී එම වැටුප් ක්‍රමයට ගැලපීම සලකා නොබලන බවද, වැඩිදුරටත් දැනුම් දෙමි.

03. මෙම චක්‍රලේඛය වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් වරයාගේ එකඟතාවය ඇතිව වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ නියෝගය පරිදි නිකුත් කරනු ලැබේ.

රේණුකා පී. විජේරූප.
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව (වයඹ)

පිටපත්- :

1. ප්‍රධාන ලේකම් - වයඹ පළාත. - කා. දැ.පි.
2. ලේකම්, සමුපකාර සංවර්ධන, වෙළඳ,ඉඩම්,විදුලිබල හා බල ශක්ති , ක්‍රීඩා හා යෞවනකටයුතු, සංස්කෘතික, කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය (වයඹ) - කා. දැ.පි.
3. සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ටාර් (වයඹ පළාත) - දැ.ගැ.පි - අ.ක.ස.
4. සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.ගැ.පි.- අ.ක.ස.
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් - කුරුණෑගල,හලාවත,කුලියාපිටිය,මහව. - දැ.ගැ.පි.- අ.ක.ස.